## දැක්ම

යහපත් රාජ්‍ය පාලනයක් ඇති කිරීම සඳහා, නොයෙකුත් රාජ්‍ය ප්‍රතිපත්තීන් නීතිය බවට පරිවර්තනය කරමින් ශ්‍රී ලංකා ජනරජයට සහාය වීම.

## මෙහෙවර

රාජ්‍ය ප්‍රතිපත්තීන් නීතිය බවට පරිවර්තනය කිරීමේ දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව ඊට අදාළ පනත් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුනෙන්ම සම්පාදනය කිරීම

# හැඳින්වීම

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව "ඒ" ශ්‍රේණියේ රාජ්‍ය දෙපාර්තමේන්තුවකි. මෙම දෙපාර්තමේන්තුව අංක 1651/20 හා 2010.04.30 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව අතිගරු ජනාධිපතිතුමාගේ සෘජු අධීක්ෂණය යටතේ පවතී.

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කාර්යභාරය වනුයේ, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද තීරණ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව, විවිධ විෂයයන් පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තීන් ලිඛිත නීතිය බවට පරිවර්තනය කිරීම ය. එසේ රාජ්‍ය ප්‍රතිපත්තීන් නීතිය බවට පරිවර්තනය කිරීමේ කාර්යාවලියේ දී දෙපාර්තමේන්තුව විසින්, නව නීති පැනවීම සඳහා පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම, පවත්නා නීති සංශෝධනය කිරීමේ පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම සහ අදාළ අමාත්‍යාංශවලින් ඉදිරිපත් කරන අනු නීති ප්‍රතිශෝධනය කිරීම සිදු කරයි. පනත් කෙටුම්පත් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා පාර්ලිමේන්තු තේරීම් කාරක සභා රැස්වීම්වලට සහභාගීවීම සහ පනත් කෙටුම්පත් විවාදයට ගැනීමේ දී පාර්ලිමේන්තුව සමඟ සම්බන්ධීකරණය පවත්වා ගනිමින් අවශ්‍ය කටයුතු කිරීම දෙපාර්තමේන්තුවට පැවරී ඇති රාජකාරි කටයුතු වේ. මෙම දෙපාර්තමේන්තුව, සියලු රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ද ඇතුළු සෑම රාජ්‍ය අමාත්‍යාංශයක් හා දෙපාර්තමේන්තුවක් වෙත සේවා සලසයි. පනත් කෙටුම්පත් සහ අනු නීති සැකසීම සම්බන්ධයෙන් නොයෙකුත් රාජ්‍ය අමාත්‍යාංශ හා රාජ්‍ය දෙපාර්තමේන්තුවලට නෛතික උපදෙස් ලබාදීම ද, දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබන රාජකාරියකි.

## 1. පනත් කෙටුම්පත් සම්පාදනය කිරීමට අදාළව දෙපාර්තමේන්තුවේ කර්තව්‍ය වනුයේ :-

(1) නව නීති පැනවීම සඳහා ද පවත්නා නීති සංශෝධනය කිරීම සඳහා ද භාෂාත්‍රයෙන් පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම.

(2) අනු නීති භාෂාත්‍රයෙන් ප්‍රතිශෝධනය කිරීම සහ (අවශ්‍ය අවස්ථාවල දී) අනු නීති කෙටුම්පත් කිරීම.

(3) පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් නෛතික උපදෙස් ලබා දීම.

(4) ව්‍යවස්ථා සම්පාදනය හා සම්බන්ධ පාර්ලිමේන්තු රාජකාරි ඉටු කිරීම.

(5) පළාත් සභා සඳහා ප්‍රඥප්ති කෙටුම්පත් කිරීම,

(6) පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත් (සංස්ථාගත කිරීමේ පනත් කෙටුම්පත්) භාෂාත්‍රයෙන් ප්‍රතිශෝධනය කිරීම.

(7) අවස්ථාවෝචිත පරිදි, අදාළ රේඛීය අමාත්‍යාංශවල පූර්ණ සහයෝගය සහ අනුමැතිය ඇතිව නීති කෙටුම්පත් සම්පාදනයට අදාළ රාජ්‍ය ප්‍රතිපත්තීන් ප්‍රායෝගිකව, සාර්ථකව ක්‍රියාත්මක කළ හැකි වන පරිදි ප්‍රතිනිර්මාණය කිරීම.

මෙම දෙපාර්තමේන්තුවේ විශේෂ ලක්ෂණය වන්නේ, එයටම සීමා වූ වැඩසටහනක් නොතිබීම යි. අමාත්‍ය මණ්ඩලය විසින් නියමිත ප්‍රතිපත්ති අනුමත කිරීමෙන් පසුව, රජයේ අමාත්‍යාංශවල හා එම අමාත්‍යාංශ යටතේ ඇති දෙපාර්තමේන්තුවල ව්‍යවස්ථා සම්පාදක අවශ්‍යතා මත දෙපාර්තමේන්තුවේ වැඩසටහන සකස් වී තිබීම ඊට හේතුව යි. එබැවින් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය, යම් නිශ්චිත වර්ෂයක් මුළුල්ලේ ප්‍රාථමික ව්‍යවස්ථා, ව්‍යවස්ථා සංශෝධන හා අනුනීති සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හා එම ඉල්ලීම් සාර්ථකව නිම කිරීම යන පදනම මත සකස් වී ඇත. දෙපාර්තමේන්තුවේ මූලික කාර්ය භාරය වන නීති සම්පාදනයෙහි විෂය පථයට ඇතුළත් වන කවර ආකාරයක හෝ වූ නීති, එය ඉල්ලා සිටින අමාත්‍යාංශයට හෝ දෙපාර්තමේන්තුවට මුද්‍රා හැරීමට පෙර භාෂා තුනෙන් ම සම්පූර්ණ කරනු ලැබිය යුතු ය.

## 2. කාර්ය මණ්ඩලය

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල සංයුතිය පහත සඳහන් පරිදි වේ. අනුමත ඒකාබද්ධ කාර්ය මණ්ඩලය 151 ක් වන අතර 2014 වර්ෂයේ සේවයේ නියුතුව සිටි කාර්ය මණ්ඩලය 86 ක් වේ.

| තනතුරු වර්ග | අනුමත කාර්ය මණ්ඩලය | සේවයේ නියුතුව සිටි කාර්ය මණ්ඩලය |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 37 | 27 |
| තෘතීය මට්ටම | 28 | 03 |
| ද්විතීය මට්ටම | 62 | 36 |
| ප්‍රාථමික මට්ටම | 24 | 20 |

| නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ 2014.12.31 දිනට කාර්ය මණ්ඩලය | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | | **තෘතීය මට්ටම** | | | **ද්විතීය මට්ටම** | | | **ප්‍රාථමික මට්ටම** | | |
| | **අනුමත** | **තත්‍ය** | | **අනුමත** | **තත්‍ය** | | **අනුමත** | **තත්‍ය** | | **අනුමත** | **තත්‍ය** |
| නීති කෙටුම්පත් සම්පාදක | 01 | 01 | පරිපාලන නිලධාරී | 01 | - | අයවැය සහකාර | 01 | 01 | රියදුරු | 10 | 06 |
| අතිරේක නීති කෙටුම්පත් සම්පාදක | 01 | 01 | ප්‍රධාන භාෂා පරිවර්තක | 02 | 02 | ගිණුම් සහකාර | 01 | - | කාර්යාල කාර්ය සහායක | 14 | 14 |
| නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක | 05 | 05 | භාෂා පරිවර්තක | 24 | 01 | පුස්තකාලයාධිපති | 01 | 01 | | | |
| ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක | 08 | 03 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 01 | - | රාජ්‍ය කළමනාකරණ සහකාර | 28* | 21 | | | |
| සහකාර නීති කෙටුම්පත් සම්පාදක | 20 | 15 | | | | ලේඛන සහකාර | 20 | 10 | | | |
| ප්‍රධාන ගණකාධිකාරී | 01 | 01 | | | | සංස්කාරක | 11 | 03 | | | |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ | 01 | 01 | | | | | | | | | |
| එකතුව | 37 | 27 | | 28 | 03 | | 62 | 36 | | 24 | 20 |
| මුළු එකතුව | | | | අනුමත ගණන 151 | | | තත්‍ය ගණන 86 | | | | |

*රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් 28 දෙනෙකු අනුමත අතර, ලේඛන සහකාර 20 දෙනෙකු බඳවා ගැනීමට අනුමැතිය ලැබී තිබුණ ද, ලේඛන සහකාර නිලධාරීන් 10 දෙනෙකු පමණක් බඳවා ගෙන ඇත.

**<u>දෙපාර්තමේන්තුවේ පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග</u>**

දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්යභාරය ඉටුකිරීම සඳහා අනුමත සේවක සංඛ්‍යාව 151 කි. එසේ වුව ද එකී කාර්යභාරය ඉටුකිරීම සඳහා දෙපාර්තමේන්තුවේ 2014 වර්ෂයේ සිටි තත්‍ය සේවක සංඛ්‍යාව 86 ක් පමණි. මෙහි පහත දක්වා ඇති පරිදි විවිධ සේවා ගණවල සේවා නියුක්තිය සම්බන්ධයෙන් පුරප්පාඩු 65 ක් පිරවීමට තිබේ :-

**ජ්‍යෙෂ්ඨ මට්ටම**

(අ) ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරු 05 ක් පුරප්පාඩු වී පවතී. අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුව, සුදුසුකම්ලත් සහකාර නීති කෙටුම්පත් සම්පාදක නිලධාරීන් නොමැති බැවින් එය සම්පූර්ණ කිරීමට නොහැකිව පවතී.

(ආ) සහකාර නීති කෙටුම්පත් සම්පාදක පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 05 කි. එම පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට ගැසට් නිවේදනයේ පළ කිරීමට කටයුතු සිදු කරමින් පවතී.

**තෘතීය මට්ටම**

(අ) පරිපාලන නිලධාරී තනතුර පුරප්පාඩුව පවතී. පුරප්පාඩුව සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා යවා ඇති අතර, ඉදිරි බඳවා ගැනීම්වල දී නිලධාරියෙකු ලබා දීමට කටයුතු කරන බව දන්වා ඇත.

(ආ) භාෂා පරිවර්තක තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව 23 කි. පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කටයුතු කරමින් පවතී.

(ඇ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී තනතුර පුරප්පාඩුව පවතී. පුරප්පාඩුව සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා යවා ඇති අතර, ලබා දීමට නිලධාරියකු නොමැති බැවින් ස්ථාන මාරු ඉල්ලීම් මඟින් හෝ ඉදිරි බඳවා ගැනීම්වලින් නිලධාරියෙකු ලබා දීමට කටයුතු කරන බව දන්වා ඇත.

**ද්විතීය මට්ටම**

(අ) ගිණුම් සහකාර තනතුර පුරප්පාඩුව පවතී. පුරප්පාඩුව සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා යවා ඇති අතර, සුදුසු නිලධාරියකු ලද පසු ස්ථානමාරු කර එවීමට කටයුතු කරන බව දන්වා ඇත.

(ආ) අදාළ කාලසීමාව තුළ පැවති අවශ්‍යතාවය අනුව ලේඛන සහකාර තනතුර සඳහා නිලධාරීන් දසදෙනෙකු සහ සංස්කාරක තනතුර සඳහා නිලධාරීන් තිදෙනෙකු බඳවා ගැනීමට කටයුතු කර ඇති අතර ලේඛන සහකාර තනතුරෙහි පුරප්පාඩු 13 ක් සහ සංස්කාරක තනතුරෙහි පුරප්පාඩු 08 ක් දැනට පවතී.

**ප්‍රාථමික මට්ටම**

රියදුරු සේවයේ 2014 වර්ෂය අවසාන වන විට පැවති පුරප්පාඩු සංඛ්‍යාව 04 කි.

**3. දෙපාර්තමේන්තුවේ අංශ**

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්යය පහත සඳහන් අංශ මඟින් ක්‍රියාත්මක වේ.

නීති කෙටුම්පත් සම්පාදන අංශය

ආයතන හා පාලන අංශය

භාෂා පරිවර්තන අංශය

ප්‍රකාශන අංශය

ගිණුම් අංශය

# නීති කෙටුම්පත් සම්පාදන අංශය

**ක්‍රියාත්මක කරන ප්‍රධාන කාර්යයන් :-**

- රාජ්‍ය ප්‍රතිපත්ති නීතිය බවට පරිවර්තනය කිරීම.
- නව නීති පැනවීමට සහ නීති සංශෝධනය කිරීමට භාෂාත්‍රයෙන් පනත් කෙටුම්පත් සකස් කිරීම.
- නොයෙකුත් රාජ්‍ය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් නෛතික උපදෙස් ලබා දීම.
- ව්‍යවස්ථා සම්පාදනය හා සම්බන්ධ පාර්ලිමේන්තු රාජකාරි ඉටු කිරීම.
- පළාත් සභා සඳහා ප්‍රඥප්ති කෙටුම්පත් කිරීම.

## 2014 වර්ෂයට අදාළ පනත් කෙටුම්පත් සම්බන්ධ විස්තර සටහන

| | කෙටුම්පත් කිරීම (වර්ෂය මුල) | වර්ෂය තුළ පාර්ශවයන් වෙතින් ලැබුණු ඉල්ලීම් සංඛ්‍යාව | පවතින පනත් සඳහා ලද නව ඉල්ලීම් | එකතුව | කෙටුම්පත් සකස් කර අදාළ පාර්ශවයන් වෙත ලබාදුන් සංඛ්‍යාව | වසන ලද ගොනු | සම්බන්ධ කරන ලද ගොනු | කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලුම් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| පනත් කෙටුම්පත් කිරීම නව නීති හා සංශෝධන නීති | 154 | 39 | 5 | 198 | 35 | 1 | - | 162 |
| පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත් | 95 | 22 | 15 | 132 | 50 | - | - | 82 |
| පළාත් සභා ප්‍රඥප්ති | 20 | - | - | 20 | 1 | - | - | 19 |
| උපකාරක නීති (නියෝග, රීති, නියමයන් ආදිය) | 101 | 22 | 100 | 223 | 99 | - | - | 124 |

## 2014 වර්ෂය තුළ පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද පනත් කෙටුම්පත්

| අනු අංකය | පනත් කෙටුම්පතෙහි නම | | |
|---|---|---|---|
| 01 | 2014 අංක 01 | එල්.ඩී.ඕ. 34/2012 | ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යාපන ආයතනය (සංශෝධන) පනත |
| 02 | 2014 අංක 02 | එල්.ඩී.ඕ. 36/2012 | ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය (සංශෝධන) පනත |
| 03 | 2014 අංක 03 | එල්.ඩී.ඕ. අයි.එන්.සී. 12/2011 | ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතන (සංස්ථාගත කිරීමේ) පනත |
| 04 | 2014 අංක 04 | එල්.ඩී.ඕ. අයි.එන්.සී. 11/2012 | පිලිප් ගුණවර්ධන ගුණානුස්මරණ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත |
| 05 | 2014 අංක 05 | එල්.ඩී.ඕ. අයි.එන්.සී. 03/2012 | චන්ද්‍රිම වීරක්කොඩි පදනම (සංස්ථාගත කිරීමේ) පනත |
| 06 | 2014 අංක 06 | එල්.ඩී.ඕ. 81/2006(II) | වෛද්‍ය (සංශෝධන) පනත |
| 07 | 2014 අංක 07 | එල්.ඩී.ඕ. 04/2014 | එකතු කල අගය මත බදු (සංශෝධන) පනත |
| 08 | 2014 අංක 08 | එල්.ඩී.ඕ. 05/2014 | දේශීය ආදායම් (සංශෝධන) පනත |
| 09 | 2014 අංක 09 | එල්.ඩී.ඕ. 07/2014 | ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත |
| 10 | 2014 අංක 10 | එල්.ඩී.ඕ. 06/2014 | ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත |
| 11 | 2014 අංක 11 | එල්.ඩී.ඕ. 08/2014 | විදුලි සංදේශ බදු (සංශෝධන) පනත |
| 12 | 2014 අංක 12 | එල්.ඩී.ඕ. 10/2014 | විශේෂ වෙළඳ භාණ්ඩ බදු (සංශෝධන) පනත |
| 13 | 2014 අංක 13 | එල්.ඩී.ඕ. 11/2014 | සමාගම් (සංශෝධන) පනත |
| 14 | 2014 අංක 14 | එල්.ඩී.ඕ. 12/2014 | ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු පියවීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත |
| 15 | 2014 අංක 15 | එල්.ඩී.ඕ. 13/2014 | මුදල් නීති (සංශෝධන) පනත |
| 16 | 2014 අංක 16 | එල්.ඩී.ඕ. අයි.එන්.සී. 18/2012 | සමස්ථ ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත |
| 17 | 2014 අංක 17 | එල්.ඩී.ඕ. අයි.එන්.සී. 15/2010 | බෞද්ධ සිද්ධස්ථාන පුනරුත්ථාපනය කිරීමේ පදනම (සංස්ථාගත කිරීමේ) පනත |

| | | | |
|---|---|---|---|
| 18 | 2014 අංක 18 | එල්.ඩී.ඕ. 40/2011 | ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත |
| 19 | 2014 අංක 19 | එල්.ඩී.ඕ. අයි.එන්.සී. 22/2010 | කුමාරසිරි හෙට්ටිගේ පදනම (සංස්ථාගත කිරීමේ) පනත |
| 20 | 2014 අංක 20 | එල්.ඩී.ඕ. අයි.එන්.සී. 13/2013 | මොහාන් ලාල් ග්‍රේරු පදනම (සංස්ථාගත කිරීමේ) පනත |
| 21 | 2014 අංක 21 | එල්.ඩී.ඕ. අයි.එන්.සී. 31/2012 | වික්ටර් ඇන්ටනී අධ්‍යාපන, සමාජ, ආර්ථික සත්කාරය හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ) පනත |
| 22 | 2014 අංක 22 | එල්.ඩී.ඕ. අයි.එන්.සී. 30/2010 | දාම්පේ, මීගොඩ, බෝධිවර්ධනාරාම, ශ්‍රී මධුරසාම පිරිවෙන් විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත |
| 23 | 2014 අංක 23 | එල්.ඩී.ඕ. අයි.එන්.සී. 23/2012 | නිමල් සිරිපාල ද සිල්වා ප්‍රජා සංවර්ධන පදනම |
| 24 | 2014 අංක 24 | එල්.ඩී.ඕ. අයි.එන්.සී. 01/2013 | ලක්ෂ්මන් වසන්ත පෙරේරා ප්‍රජා සංවර්ධන පදනම |
| 25 | 2014 අංක 25 | එල්.ඩී.ඕ. 50/2011 | ශ්‍රී ලංකා මූලික අධ්‍යාපන ආයතන (සංශෝධන) පනත |
| 26 | 2014 අංක 26 | එල්.ඩී.ඕ. 28/2013 | කාලාවරෝධ (සංශෝධන) පනත |
| 27 | 2014 අංක 27 | එල්.ඩී.ඕ. අයි.එන්.සී. 28/2010 | ජෝන් සෙනෙවිරත්න පදනම (සංස්ථාගත කිරීමේ) පනත |
| 28 | 2014 අංක 28 | එල්.ඩී.ඕ. අයි.එන්.සී. 35/2011 | බෝධිරාජාරාම අධ්‍යාපනික හා සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ) පනත |
| 29 | 2014 අංක 29 | එල්.ඩී.ඕ. අයි.එන්.සී. 24/2012 | වසන්ත සේනානායක පදනම (සංස්ථාගත කිරීමේ) පනත |
| 30 | 2014 අංක 30 | එල්.ඩී.ඕ. අයි.එන්.සී. 18/2013 | ලංකාවේ රෝමානු කතෝලික අග්‍රරාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා (සංශෝධන) පනත |
| 31 | 2014 අංක 31 | එල්.ඩී.ඕ. 31/2011 | ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය |
| 32 | 2014 අංක 32 | එල්.ඩී.ඕ. අයි.එන්.සී. 36/2012 | පියසේන ගමගේ පදනම (සංස්ථාගත කිරීමේ) පනත |
| 33 | 2014 අංක 33 | එල්.ඩී.ඕ. 59/2005 | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත |
| 34 | 2014 අංක 34 | එල්.ඩී.ඕ. 3/2014 | මහනගර සභා (සංශෝධන) පනත |

| | | | |
|---|---|---|---|
| 35 | 2014 අංක 35 | එල්.ඩී.ඕ. 3/2014 | නගර සභා (සංශෝධන) පනත |
| 36 | 2014 අංක 36 | එල්.ඩී.ඕ. 3/2014 | ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත |
| 37 | 2014 අංක 37 | එල්.ඩී.ඕ. 3/2014 | පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පියවීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත |
| 38 | 2014 අංක 38 | එල්.ඩී.ඕ. 23/2013 | ඉඩම් (සන්තකය පැවරීම සීමාකිරීමේ) පනත |
| 39 | 2014 අංක 39 | එල්.ඩී.ඕ. 25/2014 | ඩී.එෆ්.සී.සී. බැංකුව (ඉවත් කිරීමේ හා ආනුෂංගික විධිවිධාන) පනත |
| 40 | 2014 අංක 40 | එල්.ඩී.ඕ. 39/2011 | ශ්‍රී ලංකා පරමාණු බලශක්ති පනත |
| 41 | 2014 අංක 41 | එල්.ඩී.ඕ. 33/2014 | විසර්ජන පනත |
| 42 | 2014 අංක 42 | එල්.ඩී.ඕ. අයි.එන්.සී. 23/2012 | කල්පවෘක්ෂ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත |
| 43 | 2014 අංක 43 | එල්.ඩී.ඕ. අයි.එන්.සී. 33/2013 | සිව්මුනි සෑ වෙහෙර බෞද්ධ පදනම (සංස්ථාගත කිරීමේ) පනත |
| 44 | 2014 අංක 44 | එල්.ඩී.ඕ. අයි.එන්.සී. 11/2013 | පී.හැරිසන් ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත |
| 45 | 2014 අංක 45 | එල්.ඩී.ඕ. අයි.එන්.සී. 19/2013 | මානසික උපප්‍රකෘති ළමා පාසලේ සුහසාධක සමිතිය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත |
| 46 | 2014 අංක 46 | එල්.ඩී.ඕ. අයි.එන්.සී. 34/2011 | ශ්‍රී ලංකාවේ සමාජ කාර්යයන්හි නියුක්ත වෘත්තියවේදීන්ගේ සංගමය |
| 47 | 2014 අංක 47 | එල්.ඩී.ඕ. 34/2014 | විසර්ජන පනත |

සටහන :

- එල්.ඩී.ඕ. යනුවෙන් අදහස් වන්නේ නව නීති හා සංශෝධන නීතිවලට අදාළ පනත් කෙටුම්පත් ලිපිගොනු වේ.
- එල්.ඩී.ඕ. අයි.එන්.සී. යනුවෙන් අදහස් වන්නේ පෞද්ගලික මන්ත්‍රීන්ගේ සංස්ථාගත කිරීමේ පනත් කෙටුම්පත් ලිපිගොනු වේ.

# ආයතන අංශය හා පාලන අංශය

ආයතන අංශය හා පාලන අංශය මගින් කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, උසස් කිරීම, පුහුණු කිරීම සඳහා යොමු කිරීම, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම හා විනය කටයුතු, වාහන පහසුකම් හා සම්බන්ධ කටයුතු සහ දෙපාර්තමේන්තුවේ අනෙකුත් සියලු ආයතනික හා පරිපාලන කටයුතු ඉටු කරනු ලබයි.

## (1) බඳවා ගැනීම, උසස් කිරීම් සහ විනය පාලනය

i. පුරප්පාඩුව පැවති ලේඛන සහකාර තනතුරු සඳහා නිලධාරීන් 10 දෙනෙකු බඳවා ගන්නා ලදී.

ii. සංස්කාරක තනතුරු සඳහා නිලධාරීන් 03 දෙනෙකු බඳවා ගැනීමට කටයුතු කරන ලද අතර, ඉන් නිලධාරීන් දෙදෙනෙකු 2014.12.31 දින වන විට සේවයට වාර්තා කර ඇත.

iii. පුරප්පාඩුව පැවති කාර්යාල සේවක සේවයේ තනතුරු 04 ක් සඳහා සේවකයින් බඳවා ගැනීමට කටයුතු කරන ලදී.

iv. තමන්ට එරෙහිව චෝදනා ඉදිරිපත් වී තිබූ නීති නිලධාරියා එම චෝදනාවලට වරදකරු වීම හේතුවෙන් සේවයෙන් පහ කරන ලදී.

## (2) පුහුණු කිරීම්

### දේශීය පුහුණු

දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පහත සඳහන් පරිදි දේශීය පුහුණුවීම් සඳහා යොමුකර ඇතඃ

i. <u>*ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය*</u>

| | | |
|---|---|---|
| නීති නිලධාරීන් | - | 05 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | - | 02 |

ii. *නිපුණතා සංවර්ධන පදනම*

| | | |
|---|---|---|
| නීති නිලධාරීන් | - | 09 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | - | 04 |
| රියැදුරන් | - | 04 |
| කාර්යාල සේවක සේවය | - | 01 |

iii. *ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය*

| | | |
|---|---|---|
| කාර්යාල සේවක සේවය | - | 01 |

iv. *ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය (Cetrac)*

| | | |
|---|---|---|
| රියැදුරන් | - | 02 |

ඉහත දක්වා ඇති පුහුණුවීම් හැර, නීති නිලධාරීන් දේශීය වැඩමුළු 02 කට සහභාගි වී ඇත. තව ද, නීති නිලධාරීන් වෙනුවෙන් දින තුනක Presentation Skills වැඩමුළුවක් දෙපාර්තමේන්තුව තුළ දී පවත්වන ලදී.

මීට අමතරව, දෙපාර්තමේන්තුවේ කාර්යයන් වඩාත් ඵලදායී ලෙස ඉටු කිරීමට හැකියාව ලබාගනු පිණිස නීතිය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා නීති නිලධාරීන් 05 දෙනෙකු වෙනුවෙන් ප්‍රතිපාදන ලබාදීමට කටයුතු කර ඇත.

**විදේශීය පුහුණු**

i. දෙපාර්තමේන්තුවේ නීති කෙටුම්පත් සම්පාදකවරයා තායිලන්තයේ පැවති 2014 ආසියා නීති සමුළුවට සහ ඉතාලියේ පැවති 75 වන සරණාගත නීති පාඨමාලාවට සහභාගි විය.

ii. එක්සත් රාජධානියේ පැවති ව්‍යවස්ථා කෙටුම්පත් කිරීමේ පාඨමාලාව - 2014 සඳහා අතිරේක නීති කෙටුම්පත් සම්පාදකවරිය සහභාගී විය.

iii. ඇමෙරිකා එක්සත් ජනපදයේ පැවති ජාත්‍යන්තර නීති කෙටුම්පත් කිරීමේ ආයතනයේ පුහුණු වැඩමුළුවක් සඳහා නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදකවරියක් ද, ඉන්දියාවේ

පැවති තොරතුරු තාක්ෂණ නීති බලාත්මක කිරීමේ වැඩමුළුවක් සඳහා ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදකවරියක් ද සහභාගි විය.

iv. තායිලන්තයේ පැවති 2014 ආසියා නීති සමුළුවට නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදකවරියන් දෙදෙනෙක් ද සහභාගි වූ අතර නේපාලයේ පැවති ජාත්‍යන්තර මානව නීතිය පිළිබඳ 25 වන දකුණු ආසියාතික අධ්‍යාපන සැසිවාරය සඳහා නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදකවරියක් සහභාගි විය.

**නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් සහභාගී වූ විදේශ සම්මන්ත්‍රණ - 2014 වර්ෂය**

| | **සම්මන්ත්‍රණයේ නම සහ පැවැත්වූ රට** | **සහභාගී වූ නිලධාරියාගේ නම** |
|---|---|---|
| 1. | ආසියා නීති සමුළුව 2014 - තායිලන්තය | නීති කෙටුම්පත් සම්පාදක පී.එස්.ඒ. ද සිල්වා මහතා<br><br>නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක ටී.ඒ.වයි.එම්.රණවන මිය<br><br>නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක ඩී.ඩී.කුලසේන මෙනවිය |

**නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් සහභාගී වූ විදේශ වැඩමුළු - 2014 වර්ෂය**

| | **වැඩමුළුවේ නම සහ පැවැත් වූ රට** | **සහභාගී වූ නිලධාරියාගේ නම** |
|---|---|---|
| 1. | 75 වන සරණාගත නීති පාඨමාලාව - ඉතාලිය | නීති කෙටුම්පත් සම්පාදක පී.එස්.ඒ. ද සිල්වා මහතා |

| | | |
|---|---|---|
| 2. | ජාත්‍යන්තර මානව නීතිය පිළිබඳ 25 වන දකුණු ආසියාතික අධ්‍යයන (SATS) - නේපාලය | නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක කේ.ආර්.වයි.හපුආරච්චි මිය |

<u>**නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් සහභාගී වූ විදේශ පුහුණු - 2014 වර්ෂය**</u>

| | **පුහුණුවේ නම සහ පැවැත් වූ රට** | **සහභාගී වූ නිලධාරියාගේ නම** |
|---|---|---|
| 1. | නීති ව්‍යවස්ථා කෙටුම්පත් කිරීමේ පාඨමාලාව - 2014, එක්සත් රාජධානිය | අතිරේක නීති කෙටුම්පත් සම්පාදක ඩී.එස්.එච්.කුමාරජීව මිය |
| 2. | ජාත්‍යන්තර නීති කෙටුම්පත් කිරීමේ ආයතනය - 2014, ඇමෙරිකා එක්සත් ජනපදය | නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක එස්.ඒ.දිල්රුක්ෂි මිය |
| 3. | තොරතුරු තාක්ෂණ නීති බලාත්මක කිරීම - ඉන්දියාව | ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක ඩී.ඩී.වීරක්කොඩි මිය |

## (3) අනෙකුත් ආයතනික හා පාලන කටයුතු

i. දේශීය හා විදේශීය නීතිමය තත්ත්වයන් පිළිබඳව නිලධාරීන්ගේ දැනුම හා හැකියාව වර්ධනය උදෙසා දෙපාර්තමේන්තුවේ 1 ශ්‍රේණියේ පුස්තකාලයක් ස්ථාපිතව ඇති අතර, 2014 වර්ෂයේ දේශීය හා විදේශීය නීති පොත් 11 ක් මිළදී ගෙන ඇත.

ii. සේවක සුභසාධනය වෙනුවෙන් පොදු සුභසාධක සංගමයක් පවතී. එමගින් 2014 වර්ෂයේ දී, සාමාජිකයන් සඳහා ණය පහසුකම් සැපයීම, කාර්ය මණ්ඩල අතර සුහදතාවය වර්ධනය කිරීම උදෙසා විනෝද චාරිකා සංවිධානය කිරීම හා සංස්කෘතික උත්සව පැවැත්වීම සහ මානසික සංවර්ධනය උදෙසා ආගමික වැඩසටහන් සංවිධානය කිරීම සිදු කරන ලදී.

iii. නීති නිලධාරීන්ගේ සුභසාධනය වෙනුවෙන් නීති නිලධාරීන්ගේ සංගමයක් ද ඇත. නීති නිලධාරීන්ගේ වෘත්තිමය නිපුණතා වර්ධනය මෙන්ම අනෙකුත් සුභසාධන කටයුතු මෙම සංගමය මඟින් ඉටු කරයි.

iv. දෙපාර්තමේන්තුවේ සියලුම පරිගණක ජාලගත කර ඇති අතර, සියලුම මාණ්ඩලික නිලධාරීන් මෙන්ම අනෙකුත් සුදුසු නිලධාරීන් සඳහා පරිගණක හා අන්තර්ජාල පහසුකම් ලබා දී ඇත. අනෙකුත් නිලධාරීන්ට ද පරිගණක හා අන්තර්ජාල ප්‍රවේශ පහසුකම් ලබා දී ඇත. සියලුම නිලධාරීන්ට නව තාක්ෂණය භාවිතා කිරීමට අවස්ථාව ලබාදීම මගින් e-රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කර ඇත.

## භාෂා පරිවර්තන අංශය

මෙම දෙපාර්තමේන්තුවේ නීති අංශය මඟින් ඉංග්‍රීසි බසින් සකස් කරනු ලබන නීති කෙටුම්පත් (නව නීති සහ සංශෝධන නීති) සහ ප්‍රතිශෝධනය කරනු ලබන උපකාරක නීති, අදාළ රාජ්‍ය භාෂාවලට පරිවර්තනය කිරීම ද දෙපාර්තමේන්තුවේ ආයතන, පාලන සහ ගිණුම් අංශවල රාජකාරි ලිපිලේඛන අදාළ භාෂාවලට පරිවර්තනය කිරීම ද භාෂා පරිවර්තන අංශය මඟින් සිදු කරනු ලබයි.

## ප්‍රකාශන අංශය

පනත් කෙටුම්පත් හා උපකාරක නීතිවල ඉංග්‍රීසි, සිංහල හෝ දෙමළ පිටපත්වල සෝදුපත් බැලීම, පරීක්ෂා කිරීම ද පාර්ලිමේන්තුව හා රජයේ මුද්‍රණාලය විසින් එවනු ලබන පනත් කෙටුම්පත්වල අත් පිටපත් හා ගුරු පිටපත් කියවා බැලීම ද නීති නිලධාරින්ගේ අධීක්ෂණය යටතේ එවැනි පිටපත් හා සම්බන්ධ සංස්කරණ කටයුතු සිදු කිරීම කරන අතරවාරයේ දී දෙපාර්තමේන්තුව සහ පාර්ලිමේන්තුව අතර සම්බන්ධීකරණ කටයුතු කිරීම ද, පනත් ගැසට් පත්‍රයේ පළ කිරීමට පියවර ගැනීම යනාදී කටයුතු නිසි ආකාරයෙන් සිදු කිරීම ද මෙම අංශය මඟින් සිදුකරනු ලබයි.

# ගිණුම් අංශය

## 015 නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

**2014.01.01 - 2014.12.31**

**වැය විස්තරය**

ශීර්ෂය : 015 - නීති කෙටුම්පත් සම්පාදක

වැඩසටහන : 01 මෙහෙයුම්

ව්‍යාපෘතිය : 01 සාමාන්‍ය පරිපාලනය හා නීති කෙටුම්පත් කිරීම

(අ) 2014.01.01 සිට 2014.12.31 දක්වා පුනරාවර්තන වියදම්

| **පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර** | **අයවැය ප්‍රතිපාදන (රු.)** | **ශුද්ධ ප්‍රතිපාදන (රු.)** | **මුලු වියදම් (රු.)** |
|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 41,000,000 | 41,000,000 | 39,871,636 |
| අනෙකුත් වියදම් | 28,845,000 | 28,845,000 | 28,107,404 |
| **පුනරාවර්තන වියදම්වල එකතුව** | **69,845,000** | **69,845,000** | **67,979,040** |

2014.01.01 සිට 2014.12.31 දක්වා ප්‍රාග්ධන වියදම්

| **ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර** | **අයවැය ප්‍රතිපාදන (රු.)** | **ශුද්ධ ප්‍රතිපාදන (රු.)** | **මුලු වියදම් (රු.)** |
|---|---|---|---|
| **මූලධන වත්කම්වල පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම** | | | |
| 2001 - ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 500,000 | 500,000 | 214,027 |
| **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | | | |
| 2102 - ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 1,000,000 | 1,000,000 | 964,241 |

| | | | |
|---|---|---|---|
| **<u>මානව සම්පත් සංවර්ධනය</u>**<br><br>2401 - කාර්ය මණ්ඩල පුහුණු (අ) | 7,800,000 | 7,800,000 | 5,835,886 |
| **<u>වෙනත් මූලධන වියදම්</u>**<br><br>2502 - ආයෝජන - නීති ග්‍රන්ථ මිලදී ගැනීම | 1,000,000 | 1,000,000 | 184,891 |
| **<u>ශ්‍රී ලංකා නිති ප්‍රඥප්ති ප්‍රතිශෝධනය කිරීම</u>**<br><br>2502 - ආයෝජන | 32,175,000 | 32,175,000 | 659,934 |
| **ප්‍රාග්ධන වියදම්වල එකතුව** | **42,475,000** | **42,475,000** | **7,858,979** |

(ආ) 2014.01.01 සිට 2014.12.31 දක්වා ආදායම් විස්තරය

| **විස්තරය** | **ඇස්තමේන්තුගත ආදායම (රු.)** | **ආදායම (රු.)** |
|---|---|---|
| පොළිය - වෙනත් | 400,000 | 496,884 |

(ආ) අත්තිකාරම් ගිණුම - 015011

(2014.01.01 - 2014.12.31)

| | **වියදමෙහි උපරිම සීමාව (රු.)** | **ලැබීම්වල අවම සීමාව (රු.)** | **හර ශේෂයන්ගේ උපරිම සීමාව (රු.)** |
|---|---|---|---|
| 2014 ඇස්තමේන්තුව | 4,000,000 | 2,000,000 | 23,000,000 |
| මු.රෙ. 503(1) - 2014.12.31 දිනට ගැලපීම් කිරීමට පෙර | 2,017,965 | 2,730,296 | 10,572,650 |

# විසර්ජන ගිණුම 2014

වියදම් ශීර්ෂ අංකය: 015

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික්ලේකම් කාර්යාලයේ නම : නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

| වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය | | (1) | (2) | (3) | (4) | (5) | (6) | |
|---|---|---|---|---|---|---|---|---|
| | වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩසටහනෙහි නම | අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | මු.රෙ. 66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම් | මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2+3) | මුළු වියදම | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම (4-5) | පිටු අංකය (අදාල ඩී.ජී.එස්.ඒ 2 ආකෘතියට අනුව) |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| | පුනරාවර්තන | | | | | | | |
| 1 | මෙහෙයුම් වැඩසටහන | 69,845,000 | - | 2,360,000<br>(2,360,000) | 69,845,000 | 67,979,040 | 1,865,960 | 2 |
| | උප එකතුව (පුනරාවර්තන) | 69,845,000 | - | 0 | 69,845,000 | 67,979,040 | 1,865,960 | |
| | මූලධන | | | | | | | |
| 1 | මෙහෙයුම් වැඩසටහන | 42,475,000 | - | - | 42,475,000 | 7,858,979 | 34,616,021 | 2 |
| | උප එකතුව (මූලධන) | 42,475,000 | | 0 | 42,475,000 | 7,858,979 | 34,616,021 | |
| | මුළු එකතුව | 112,320,000 | - | 0 | 112,320,000 | 75,838,019 | 36,481,981 | |

පිටු අංක 02 සිට 15 දක්වා ඩී.ජී.එස්.ඒ 2 සිට ඩී.ජී.එස්.ඒ 10 දක්වා වූ ආකෘති පත්‍ර වලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් අංක 16 සිට 20 දක්වා ඇතුලත් අනෙකුත් විස්තර ද මෙම විසර්ජන ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. එබැවින් ඉහත ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාල ගිණුම් තොරතුරු හා සටහන් වලට අනුකූලව පිළියෙල කර ඇති බවත්, භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ අදාල ගිණුම් සැසඳීම් කර ඇති බවත්, ඒවා නිවැරදි බවට තහවුරු වී ඇති බවත් මෙයින් සහතික කරමි.

ප්‍රධාන ගණන්දීමේ නිළධාරී
නම :
තනතුර : ඩබ්ලිව්. කමලිනී එෆ්. ද සිල්වා
ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය,
උසාවිකාධිකරණ සංකීර්ණය,
අළුත්කඩේ, කොළඹ 12.
දිනය : 2015.03.18

ගණන්දීමේ නිළධාරී
නම :
තනතුර : ජී එස් ඒ ද සිල්වා
නීති කෙටුම්පත් සම්පාදක
නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව
80 අධිකරණ මාවත
කොළඹ 12

ප්‍රධාන ගණකාධිකාරී/ ~~අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)~~
නම :
දිනය :
M. G. M. MUNAS
Chief Accountant
Legal Draftsman's Department
No. 80, Adhikarana Mawatha,
Colombo 12

(20) (136)

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT
විගණන විමසුම-AUDIT QUERY- கணக்காய்வு விசார

විමසීම් අංකය / விசாரணை இலக்கம் / Query No.. } JP/C/LDD/2/14/08

නිකුත් කරන දිනය / வழங்கிய திகதி / Date of issue } 2015 අප්‍රේල් 20 දින

Addressed to නීති කෙටුම්පත් සම්පාදක,
නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව. වෙතටයි

විෂයය / Subject / விடயம் විසර්ජන ගිණුම් විගණනය -2014
ශීර්ෂ අංක 15 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

මෙය පැහැදිලි කිරීම සඳහා තොරතුරු කැඳවීමක්/විමසීමක් වන අතර විගණන වාර්තාවක් නොවේ.
This is only query calling for information for clarification and not an audit report
இவ்விசாரணை தகவல்களைப் பெற்றுக் கொள்ளவும், பகுப்பாய்வதற்காகவுமே அன்றி இது ஒரு கணக்காய்வு அறிக்கை அல்ல.

යථෝක්ත විසර්ජන ගිණුම සම්බන්ධයෙන් කරනු ලැබූ විගණන පරීක්ෂණයේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

02. අයවැය පාලනය

ප්‍රතිපාදන ඌනඋපයෝජනය.

නිසි ලෙස කරුණු සොයා බැලීමකින් පසුව අවශ්‍ය මුල්‍ය ප්‍රතිපාදන පමණක් ලබා ගැනීමට කටයුතු නොකිරීමෙන් හෝ කළමණාකරනය විසින් නියමිත කාල වකවානු තුළදී නිශ්චිත කාර්යය සාධන ඉලක්ක සපුරා ගැනීමට කටයුතු නොකිරීම නිසා හෝ පහත සඳහන් ප්‍රතිපාදන වලින් 50% කට අධික ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි.

| වැය විෂයය | ශුද්ධ ප්‍රතිපාදනය | වියදම | ඉතිරිය | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| 15-1-1-2001 | 500,000 | 214,027 | 285,973 | 57 |
| 15-1-1-2502 | 1,000,000 | 184,891 | 815,109 | 82 |
| 15-1-1-2502 | 32,175,000 | 659,934 | 31,515,066 | 98 |

ගිට / කාර්යාධිපති ... 04/20


අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, புத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

03. බැරකම් වාර්තා කිරීමේ අඩුපාඩු.

මු.රෙ 94 විධි විධාන ප්‍රකාරව දරන ලද බැරකම් සහ වැය ප්‍රමාණය කිසිම විටක මුදල් වර්ෂය සඳහා ප්‍රතිපාදිත මුදල් නොඉක්මවිය යුතු වුවත් පහත සඳහන් වැය විෂයන්හි ඉතිරිවීම් ඉක්මවා බැරකම් වලට බැඳී තිබුණි.

| වැය විෂයය | 2014/12/31 දිනට ඉතිරිය | 2014/12/31 දිනට බැරකම | ඉතිරිය ඉක්ම වූ බැරකම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| 15-1-1-1101 | 7,013 | 28,127 | 21,114 |
| 15-1-1-1402 | 12,114 | 171,823 | 159,709 |
| 15-1-1-1403 | 70,875 | 199,621 | 128,746 |

04. ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවේ අඩුපාඩු

I 2013 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය මගින් අලෙවි කිරීමට නිර්දේශ කරන ලද තක්සේරු වටිනාකම රු.2,815ක් වූ පුස්තකාල පොත් 2014 අගෝස්තු 08 දින පැවැත්වූ වෙන්දේසියෙන් අලෙවි කරන ලද නමුත් එම පොත් වල පිරිවැය, ගිණුමෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. (ඇමුණුම 01)

II ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවේ ඇතුලත් වන දෙපාර්තමේන්තුව සතු රු.27,979,940 ක් වටිනාකමැති වාහන භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට ඇතුලත් කර නොතිබුණි.

ඉහත කරුණු සම්බන්ධයෙන් ඔබගේ අදහස් හා ගනු ලබන ක්‍රියාමාර්ග විගණනයට දන්වන්නේ නම් මැනවි.

ජේ.සුනිල් ශාන්ත

විගණන අධිකාරී

සහකාර විගණකාධිපති වෙනුවට

**පිටපත - ලේකම් , අධිකරණ අමාත්‍යාංශය**

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } JP/C/LDD/2/14/08

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2015 ජූලි 03 දින

10 JUL 2015

නීති කෙටුම්පත් සම්පාදක,

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව.

ශීර්ෂය - 15 – නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාර 2014 වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාවේ කෙටුම්පතක් මේ සමඟ එවා ඇත.

02. එම වාර්තාවේ සාවද්‍ය හෝ එකඟ විය නොහැකි හෝ ප්‍රසිද්ධ කිරීම මහජන යහපතට පටහැනි වන්නේ යැයි අදහස් කරන කරුණු කිසිවක් වේ නම් මෙම ලිපියේ දින සිට දින හතක් ඇතුළත මා වෙත දැන්වීමට කටයුතු කළ යුතු අතර මෙම කරුණු පිළිබඳව තවදුරටත් ඔබ සාකච්ඡා කිරීමට අදහස් කරන්නේ නම් ඒ බව දින තුනක් ඇතුළත මා වෙත දන්වා කාල වේලාව වෙන්කර පැමිණෙන්නේ නම් මැනවි.

03. ඉහත සඳහන් පරිදි දින හතක් ඇතුළත පිළිතුරක් නොලදහොත් කෙටුම්පත් වාර්තාවේ සඳහන් කරුණු වලට ඔබ එකඟ වූ ලෙස සළකා එම වාර්තාව පදනම් කරගෙන පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා අවසාන වාර්තාව නිකුත් කරන බව කාරුණිකව සලකන්න.

එම්.එස්. නයනකුමාර

සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

පිටපත : ලේකම්, අධිකරණ අමාත්‍යාංශය


අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

ශීර්ෂය 15 - නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය

1.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647 (ඉ) |

1.2 විසර්ජන ගිණුම

1.2.1 අයවැය විචලනය

(අ) වැය විෂයයන් 03 ක් සඳහා අධිප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 57 සිට සියයට 98 දක්වා අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ආ) 2013 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය මගින් අලෙවි කිරීමට නිර්දේශ කරන ලද තක්සේරු වටිනාකම රු.2,815 ක්වූ පුස්තකාල පොත් 2014 අගෝස්තු 08 දින පැවැත්වූ වෙන්දේසියෙන් අලෙවි කරන ලද නමුත්, එම පොත් වල පිරිවැය ගිණුමෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3 යහපාලනය සහ ගිණුම් කටයුතුභාවය

1.3.1 අභ්‍යන්තර විගණනය

දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

1.3.2 විගණන හා කළමනාකරණ කමිටුව

-----------------------------------------

දෙපාර්තමේන්තුව සඳහා විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කර නොතිබුණි.

1.4 අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යාව

-------------------------------------------------------

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| i. | ජ්‍යෙෂ්ඨ මට්ටම | 37 | 27 | 10 |
| ii. | තෘතියික මට්ටම | 28 | 03 | 25 |
| iii. | ද්විතියික මට්ටම | 62 | 36 | 26 |
| iv. | ප්‍රාථමික මට්ටම | 24 | 20 | 04 |
| | එකතුව | **151** | **86** | **65** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 65 ක් පිරවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

1.5 කාර්යසාධනය

විගණනයට ඉදිරිපත්කරන ලද තොරතුරු අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පහත දැක්වේ.

| රාජකාරියේ ස්වභාවය | 2014 ජනවාරි 01 දිනට කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීම් සංඛ්‍යාව | 2014 වර්ෂයේදි පාර්ශ්ව වෙතින් ලැබුණු ඉල්ලීම් සංඛ්‍යාව | 2014 දෙසැම්බර් 31 දින වන විට කෙටුම්පත් සකස් කර අදාල පාර්ශ්ව වෙත භාර දුන් සංඛ්‍යාව | 2014 දෙසැම්බර් 31 දිනට කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීම් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| අණ පනත් කෙටුම්පත් කිරීම(මූලික හා සංශෝධන නීති) | 19 | 39 | 28 | 30 |
| පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික පනත් | 06 | 22 | 15 | 13 |
| රෙගුලාසි සංශෝධනය කිරීම(උපකාරක නීති) | 46 | 88 | 94 | 40 |
| එකතුව | **71** | **149** | **137** | **83** |

2014 වර්ෂයේදි පනත් කෙටුම්පත් 137 ක් සකස් කර තිබූ අතර, පනත් 47 ක් පාර්ලිමේන්තුව මගින් සම්මත කර තිබුණි.

## ආයතනයේ කාර්ය සාධනය පිළිබඳ සාරාංශය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව විවිධ විෂයන් පිළිබඳව රාජ්‍ය ප්‍රතිපත්තීන් ලිඛිත නීතිය බවට පරිවර්තනය කිරීම නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ මූලික කාර්ය භාරය වේ. මෙම ක්‍රියාවලියේ දී නව පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම, පවත්නා නීති සංශෝධනය (amendment) කිරීම, පනත් කෙටුම්පත් ප්‍රතිශෝධනය (consolidation) කිරීම සහ අදාළ අමාත්‍යාංශ ඉදිරිපත් කරනු ලබන අනුනීති පුනරීක්ෂණය (revision) කිරීම ද සිදු කරනු ලැබේ. පනත් කෙටුම්පත් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා පාර්ලිමේන්තු තේරීම් කාරක සභා රැස්වීම්වලට සහභාගි වීම සහ පනත් කෙටුම්පත් විවාදයට ගැනීමේ දී පාර්ලිමේන්තුවට ගොස් අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ අනුනීති සැකසීම සම්බන්ධයෙන් නොයෙකුත් අමාත්‍යාංශ හා රාජ්‍ය දෙපාර්තමේන්තුවලට නෛතික උපදෙස් ලබාදීම ද මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරයි.

තව ද, ශ්‍රී ලංකාවේ නීති ප්‍රඥප්ති නිල වශයෙන් ඒකාබද්ධ කොට සහ ප්‍රතිශෝධනය කොට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් ප්‍රකාශයට පත්කිරීමේ වසර හතරක ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත.

'නීති කෙටුම්පත් සම්පාදක අංශය' යටතේ දක්වා ඇති පරිදි, 2014 වර්ෂයට අදාළව නීති කෙටුම්පත් සම්බන්ධව කටයුතු කර ඇත.

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව
අංක 80, අධිකරණ මාවත,
කොළඹ 12.

சட்ட வரைஞர் திணைக்களம்,
இல.80, அதிகரண மாவத்தை,
கொழும்பு 12.

තැ.පෙ. / அ.பெ. / P.O.Box 554

LEGAL DRAFTSMAN'S DEPARTMENT,
N0.80, Adhikarana Mawatha,
Colombo 12.

*දුරකථන / தொலைபேசி / Telephones : 542991, 333394*

*විදුලි පණිවුඩ* : කෙටුම්පත් , කොළඹ
*Telegrams* : DRAFTSMAN, Colombo

*ෆැක්ස් /பெக்ஸ் /Fax: 325185, 435935*

*E –mail* : Idds1@sltnet.1k


| | | |
|---|---|---|
| මගේ අංකය. / எனது இல / My No. : පී12/01/2012-විගණන විමසුම් | ඔබේ අංකය. / உமது இல. / Your No. : JP/C/LDD/2/14/08 | දිනය. / திகதி / Date. : 2015.04.29 |

විගණන අධිකාරී,

විගණන උප කාර්යාලය,

අධිකරණ ~~හා කම්කරු සබඳතා~~ අමාත්‍යාංශය,

කොළඹ 12.

**විසර්ජන ගිණුම -2014**

විගණකාධිපතිගේ JP/C/LDD/2/14/08 හා 2015. 04. 20 දිනැති ලිපියේ අංක 02 සිට 04 දක්වා විගණන නිරීක්ෂණයන්ට අදාළ පැහැදිලි කිරීම් පහත පරිදි ඉදිරිපත් කරමි.

**<u>02. 50 % ට වැඩි ප්‍රතිපාදන ඉතිරිවීම</u>**

| | |
|---|---|
| 15-1-1-2001 | සහකාර නීති කෙටුම්පත් සම්පාදක වරුන්ගේ නිල කාමර සැකසීමට අදාලව ගොඩනැගිලි ඉදිකිරීම් දෙපාර්තමේන්තුව මගින් ඇස්තමේන්තු අනුමත වීම ප්‍රමාද වීම හේතු කොටගෙන ප්‍රතිපාදන ඉතිරි විය |
| 15-1-1-2502 | නීති පොත් මිලදී ගැනීමට මිල ගනන් ඉල්ලා සිටි නමුත් ඇතැම් පොත් සඳහා මිල ගණන් ඉදිරිපත් නොවීම හා විපිත යාපා සමාගම වෙතට ලබාදුන් ඇණවුම සඳහා පොත් නොසැපයීමත් හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි විය |
| 15-1-1-2502 | නීති ප්‍රතිශෝධන ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කරනු ලැබුයේ 2014 අවසන් කාර්තුවේ වූ බැවින් ගෙවීම් කිරීමට තරම් ප්‍රමාණවත් වැඩ කොටසක් අවසන් කිරීමට නොහැකි වීම නිසා ප්‍රතිපාදන ඉතිරි විය |

**03.බැරකම් වාර්තා කිරීමේ අඩුපාඩු**

මූ. රෙ .94 විධිවිධාන ප්‍රකාරව දරන ලද බැරකම් හා වැය ප්‍රමාණය කිසිම විටක මුදල් වර්ෂය සඳහා ප්‍රතිපාදිත මුදල් නොඉක්මවිය යුතු වුවත් වැය විෂයන් තුනක ඉතිරිවීම් ඉක්මවා රු 309,569.00 ක්වූ බැදීම් වලට හේතුව පැහැදිලි කර පහත දක්වා ඇත

| වැය විෂය | 2014 .12. 31 දිනට ඉතිරිය | 2014. 12. 31 දිනට බැරකම | ඉතිරිය ඉක්මවූ බැරකම | පැහැදිලි කිරීම |
|---|---|---|---|---|
| 15-1-1-1101 | 7,013 | 28,127 | 21,114 | සහකාර අධ්‍යක්ෂ තුමියගේ පුහුණු කාල සීමාව (ජූනි /ජූලි /අගෝස්තු මාස) තුල දරණ ලද ගමන් වියදම් හේතුවෙන් ඉතිරිවීම් ඉක්මවා බැරකම් වලට බැඳීමට සිදුවිය. |
| 15-1-1-1402 | 12,114 | 171,823 | 159,709 | 2014 දෙසැම්බර් මාසයේ දුරකතන බිල්පත් 2015 ජනවාරි මාසයේ ලැබීම හේතුවෙන් බිල්පත් වල වටිනාකම කලින් නිශ්චය කල නොහැකි වීම මත ඉතිරිවීම් ඉක්මවා බැරකම් වලට බැඳීමට සිදුවිය. |
| 15-1-1-1403 | 70,875 | 199,621 | 128,746 | 2014 දෙසැම්බර් මාසයේ විදුලි බිල්පත් 2015 ජනවාරි මාසයේ ලැබීම හේතුවෙන් බිල්පත් වල වටිනාකම කලින් නිශ්චය කල නොහැකි වීම මත ඉතිරිවීම් ඉක්මවා බැරකම් වලට බැඳීමට සිදුවිය. |
| එකතුව | 90,002 | 399,571 | 309,569 | |

**04.ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවේ අඩුපාඩු**

(1) විසර්ජන ගිණුමේ ඇති පොත් සඟරා හා ජර්නල් වල ඇති 2014. 01. 01 දිනට ශේෂයෙහි 2014 අගෝස්තු මස 08 වන දින පැවැත්වූ වෙන්දේසියේ දී විකුණූ එකදු පොතක් වත් නොමැත.

එමනිසා ඒවායේ පිරිවැය ගැලපීමක් සිදු කිරීම අවශ්‍ය නොවේ. තවද එම පොත් මිලදී ගෙන ඇත්තේ දෙපාර්තමේන්තු නිලධාරීන්ට කාර්යාලයේ රාජකාරි කටයුතු සඳහා ප්‍රයෝජනයට ගැනීම පිනිස බැවින් ඒවා පුස්තකාල පරිග්‍රහන ලේඛනයට ඇතුලත් කර නොගන්නා ලදී.

(11)-අප දෙපාර්තමේන්තුව සතු රු 27,979,940.00 ක් වටිනා එම වාහන පිළිබඳ විස්තර 2014 -භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවෙහි ඇතුලත් කර ඇත (පිටපත මේ සමග අමුණා ඇත)

ජනාධිපති නීතිඥ,

ජී එස් ඒ ද සිල්වා

නීති කෙටුම්පත් සම්පාදක

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව
අංක 80, අධිකරණ මාවත,
කොළඹ 12.

சட்ட வரைஞர் திணைக்களம்,
இல.80, அதிகரண மாவத்தை,
கொழும்பு 12.

LEGAL DRAFTSMAN'S DEPARTMENT,
N0.80, Adhikarana Mawatha,
Colombo 12.

තැ.පෙ. / அ.பெ. / P.O.Box 554

දුරකථන / தொலைபேசி / Telephones : 2333394

විදුලි පණිවුඩ : කෙටුම්පත් , කොළඹ
Telegrams : DRAFTSMAN, Colombo

ෆැක්ස් /பெக்ஸ் /Fax: 325185, 435935

*E –mail* : ldds1@sltnet.1k

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය. / எனது இல / My No. | ශි 12/01/2012 - විගණන විමසුම් | ඔබේ අංකය. / உமது இல. / Your No. | JP/C/LDD/2/14/08 | දිනය. / திகதி / Date. | 2015.07. 14 |

විගණකාධිපති,

විගණකාධිපති දෙපාර්තමේන්තුව,

බත්තරමුල්ල.

**<u>ශීර්ෂය - 15 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2014 වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව.</u>**

උක්ත මැයෙන් වූ ඔබේ සමාංක හා 2015.07.03 දිනැති ලිපිය හා බැඳේ. .

ශීර්ෂය - 15 නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය උක්ත කෙටුම්පක් වාර්තාවේ සඳහන් එකඟවිය නොහැකි කරුණු සම්බන්ධයෙන් පහත පරිදි අදාල පැහැදිලි කිරීම් ඉදිරිපත් කරමි.

1:1 ලේඛණ හා පොත්පත් පවත්වා නොගැනීම.

අප දෙපාර්තමේන්තුව මඟින් වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛණයක් මු.රෙ. 1647 (ඉ) අනුව, ක්‍රමානුකූලව, ක්‍රමවත්ව හා යාවත්කාලීනව පවත්වාගෙන යනු ලැබේ. එහි පිටපතක් මේ සමඟ අමුණා ඇත. (ඇමුණුම් i)

1.2 විසර්ජන ගිණුම

1:2:1 අයවැය විචලනය

(අ) අදාල ආයතන සමඟ නිසිකලට සබඳතා පවත්වා ගනිමින්, පසුවිපරම් කිරීම් කරනු ලැබුව ද, අප පාලනයෙන් පරිබාහිර හේතු නිසා පහත සඳහන් වැය විෂයන් 3 හි ශුද්ධ ප්‍රතිපාදන 57% - 98% අතර පරාසයකින් ඉතිරිවිය.

| | |
|---|---|
| 15-1-1-2001 | සහකාර නීති කෙටුම්පත් සම්පාදකවරුන්ගේ නිල කාමර සැකසීමට අදාලව ගොඩනැගිලි ඉදිකිරීම් දෙපාර්තමේන්තුව මගින් ඇස්තමේන්තු අනුමත වීම ප්‍රමාදවීම හේතු කොටගෙන ප්‍රතිපාදන ඉතිරිවිය. |
| 15-1-1-2502 | නීති පොත් මිලදී ගැනීමට මිල ගණන් ඉල්ලා සිටි නමුත් ඇතැම් පොත් සඳහා මිල ගණන් ඉදිරිපත් නොවීම හා විජිතයාපා සමාගම වෙතට ලබා දුන් ඇණවුම සඳහා පොත් නොසැපයීමත් හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරිවිය. |
| 15-1-1-2502 | නීති ප්‍රතිශෝධන ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කරනු ලැබුයේ 2014 අවසන් කාර්තුවේ වූ බැවින් ගෙවීම් කිරීමට තරම් ප්‍රමාණවත් වැඩ කොටසක් අවසන් කිරීමට නොහැකි වීමනිසා ප්‍රතිපාදන ඉතිරි විය. |

(ආ) ජංගම නොවන වත්කම් සංකලන ලේඛනයේ වැය විෂය අංක 2502- ආයෝජන (නීති ග්‍රන්ථ මිලදී ගැනීම) ලෙස දක්වා ඇත්තේ දෙපාර්තමේන්තුවේ පුස්තකාලයට මිලදී ගන්නා නීති ග්‍රන්ථ, සඟරා සහ ජ'නල් පමණි.

දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ රාජකාරී කටයුතු සඳහා මිලදී ගන්නා පොත්පත් (ශබ්දකෝෂ, නීති පනත් නාමාවලි) මෙම ලේඛණයට ඇතුලත් නොවේ.

2013 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය මගින් අලෙවි කිරීමට නිර්දේශ කරන ලද රු.2,815/- ක් වටිනා වූ පොත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ රාජකාරී කටයුතු සඳහා මිලදී ගන්නා ලද ශබ්දකෝෂ, නීති පනත් නාමාවලි වේ.

එබැවින් එම වටිනාකම 2014 ජංගම නොවන වත්කම් සංචලන පිළිබඳ වාර්තාවේ සංකේත අංක 6112210 - පොත්පත්, සඟරා සහ ජ'නල් යටතේ ගිණුම්ගත නොකරන නිසා එහි පිරිවැයෙන් ඉවත් කිරීමට කටයුතු කිරීමක් සිදු නොකරන ලදී.

1.3 යහපාලනය සහ ගිණුම් කටයුතුභාවය

1.3.1 අභ්‍යන්තර විගණනය

2011.01.24 දින ජනාධිපති ලේකම්ට වාර්තා කර ඇති අතර, (එම ලිපියේ පිටපත් අමුණා ඇත- ඇමුණුම් ii) 2012.01.24 දිනැති ලිපිය මගින් ජනාධිපති ලේකම් වෙත තවදුරටත් දන්වා ඇත. (ඇමුණුම් iii )
2014 වන විටත් මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත නොවූ අතර, ජනාධිපති කාර්යාලයේ අභ්‍යන්තර විගණන අංශය මගින් මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරගෙන යනු ලැබීය.

ජනාධිපති නීතිඥ
ජී.එස්.ඒ ද සිල්වා
නීති කෙටුම්පත් සම්පාදක

පිටපත: ලේකම්, අධිකරණ අමාත්‍යාංශය

## ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත මධ්‍යකාලීන ක්‍රියාමාර්ග

(i) විවිධ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු සහ මන්ත්‍රීවරුන් පෞද්ගලිකව ඉදිරිපත් කරනු ලබන පනත් කෙටුම්පත් කිරීම, හා පනත් සංශෝධන කෙටුම්පත් සඳහා වන ඉල්ලීම් කඩිනමින් සකස් කර භාෂාත්‍රයෙන් ඉදිරිපත් කිරීමට ගත යුතු පියවර පිළිබඳ සියළු නීති නිලධාරීන් නිරතුරුවම දැනුවත් කර ඇත.

(ii) පළපුරුදු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ හිඟය යම්තාක් දුරට මගහරවා ගැනීමට නීති කෙටුම්පත් කිරීමේ කාර්යයන් සඳහා උපදේශකවරුන් සිව්දෙනෙකු බඳවා ගෙන ඇත.

(iii) පනත් කෙටුම්පත් හා සංශෝධන පනත් කෙටුම්පත් වල භාෂා පරිවර්තන කටයුතු සඳහා ප්‍රමාණවත් භාෂා පරිවර්තන නිලධාරීන්ගේ හිඟකමක් පවතී. දෙමළ භාෂා පරිවර්තක නිලධාරී හිඟකම හේතුවෙන් දෙමළ භාෂා පරිවර්තන කටුයතු සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දැනට සේවය කරන (නීති කෙටුම්පත් පරිවර්තනය කිරීම පිළිබඳ පළපුරුද්දක් ඇති) නිලධරයන්ගේ සහාය ලබාගෙන ඇත.

(iv) පනත් කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියට සහාය වන ලේඛන හා සංස්කාරක තනතුරුවල පවත්නා පුරප්පාඩු අතරින් යටත් පිරිසෙයින් යම් සංඛ්‍යාවක් හෝ පිරවීමේ අටියෙන්, ප්‍රකාශන සහායකයින් දහතුන් දෙනෙකු බඳවා ගනු ලැබීය.

(v) නීති නිලධාරීන්ගේ සහ අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ දැනුම හා හැකියාව වර්ධනය කිරීම ඉලක්ක කරගත් විවිධ පුහුණු වැඩසටහන්වලට සහභාගිවීම සඳහා පුළුල් පරාසයක විහිදුනු අවස්ථාවන් ඔවුන්ට ලබා දී තිබේ.

(vi) දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කොට ඇති 'අ' ශ්‍රේණියේ පුස්තකාලය මඟින් දේශීය සහ විදේශීය නීති පොත් පරිශීලනය කිරීමේ පහසුකම් සපයා දී ඇත.

(vii) නීති නිලධාරීන් ඇතුළු දෙපාර්තමේන්තුවේ අනෙකුත් සියළුම කාර්ය මණ්ඩලය රාජකාරි වේලාවන්හි දී රාජ්‍ය සේවයේ ගෞරවය ආරක්ෂා වන පරිදි සේවයෙහි නියුතු විය යුතු බවට පැහැදිලි උපදෙස් නිරතුරුව ලබා දෙන අතර නීති නිලධාරීන් මෙන්ම අනෙකුත් සියළුම කාර්ය මණ්ඩල ආදර්ශමත් පරිදි ස්වකීය රාජකාරි කටයුතු ඉටු කරනු ලබන බව ද සඳහන් කළ යුතු ව ඇත.

(viii) නවතම ගෝලීය නැඹුරුව වී ඇත්තේ ව්‍යවස්ථා සම්පාදනයේ දී සරල භාෂාව යොදා ගැනීම වන හෙයින් නීති නිලධරයන් අතර සරල භාෂාව භාවිත කිරීම ප්‍රවර්ධනය කිරීමේ අදහසින් "නීති කෙටුම්පත් සම්පාදනය සඳහා සරල භාෂාව" යන මැයෙන් වැඩසටහනක් දැනටමත් ආරම්භ කොට තිබේ. එම වැඩසටහන එක්සත් ජාතීන්ගේ සංවර්ධන ව්‍යාපෘතිය (UNDP) මඟින් අනුග්‍රහය ලබන අතර සහකාර නීති කෙටුම්පත් සම්පාදකවරු එයට උද්‍යෝගයෙන් සහභාගි වෙති.

(ix) ව්‍යවස්ථ සම්පාදනයේ දී අනුගමනය කිරීම සඳහා නීති නිලධරයන්ට භාවිතා කිරීමට හැකි වන පරිදි නිති කෙටුම්පත් සම්පාදනයට අදාළ ක්ෂේත්‍ර අළලා විශේෂ ආදර්ශ නීති සමූහයක් සකස් වෙමින් පවතී. ආදර්ශ නීති කෙටුම්පත් තිබීම කෙටුම්පත්කරුගේ කාර්යය පහසු කරන අතර දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන කෙටුම්පත්වල සාම්‍ය ද එමගින් සහතික වේ.